**පුබ්බේව දානා සුමනො - දදං චිත්තං පසාදයෙ,**
**දත්වා චත්ත මනොහොති - එසා යඤ්ඤස්ස සම්පදා**

(දානය දීමට පළමුවත්, දානය පිරිනමන අවස්ථාවෙත්, දානය පිරිනැමීමෙන් පසුත් යන තුන්සිත පහදවා ගෙන කටයුතු කිරීම දායකයා පිළිබඳ පිළිවෙතයි)


**සියනෑ ජාත්‍යන්තර විපස්සනා භාවනා සමිතිය**
**කඳුබොඩ - දෙල්ගොඩ.**
**දුරකථනය: 011-2402306**
**011-4931808**
**ෆැක්ස්: 011-2403510**


★ කරුණාකර තැපැල්පත ආපසු එවන්න.

නම .................................................................................................................................................

ලිපිනය .............................................................................................................................................

20.............................. වන දින දාන වාරය පිළිබඳවයි.

ගරුතර ස්වාමීන් වහන්ස, සිල් මෑණියනි, පින්වත, පින්වතිය,

මෙම භාවනා මධ්‍යස්ථානයට දානය සැපයීම සම්බන්ධව ඔබගේ දාන වාරය 20.........../......................... මස ........... දිනයට යෙදී ඇති බව කරුණාවෙන් දන්වා සිටිමු.

මෙදිනට ස්වාමීන් වහන්සේලා .......... නමක්ද, යෝගී පින්වතුන් ..................... දෙනෙක්ද, උපස්ථායකයින් .............. දෙනෙක් ද සිටිනු ඇත. (මෙම සංඛ්‍යාව සුළු වශයෙන් වෙනස් වීමට ඉඩ ඇති බව කරුණාවෙන් සලකන්න.)

මෙකී දිනට පැමිණ දානය පිරිනැමීමට ඔබ සූදානම් ද යන්න මෙම ලිපිය ලැබී දින 10 ක් ඇතුළත අප වෙත දන්වා එවීම වැදගත් බැවින්, ඔබගේ පිළිතුර මේ සමග එවා ඇති තැපැල්පතෙහි දන්වා එවනු මැනවි. ඔබගේ දුරකථන අංකයද සටහන් කරන්නේ නම් යෙහෙකි. හදිසි කරදරයක් නිසා ඔබ විසින් භාරගත් දාන වාරය පිරිනැමීමට නොහැකි වන අවස්ථාවක, වෙනත් අයෙකුට එම වාරය ඔබට පැවරිය හැකිය. එසේ නොහැකි නම් මුදලින් ආධාර කරන්න. එවිට අප මුදල් භාරගෙන එම කාර්‍යය ඉටු කර පින් අනුමෝදන් කරවනු ලැබේ.

**දැන ගැනීම සඳහා** සෑම දාන දායක පිංවතෙකු විසින්ම ගොඩනැගිලි නඩත්තු සඳහා රු. 1000/=ක මුදලක් ද, සේවක වැටුප් නඩත්තු සඳහා රු.1000/= ක මුදලක්ද, විදුලිය සඳහා රු. 1000/= ක මුදලක් ද ගෙවිය යුතු බව කරුණාවෙන් දන්වමි.

මුදල් එවන විට අවම වශයෙන් රු................................. ක මුදලක් හෝ එවිය යුතුය. එම මුදල මෙහි කාර්යාලයට පැමිණ හෝ මුදල් ඇණවුමක් මගින් ද කළ හැක. සියලුම මුදල් ඇණවුම් ''සීමාසහිත සියනෑ විපස්සනා භාවනා සමිතිය නමින් ද ගෙවන කාර්යාලය දෙල්ගොඩ යනුවෙන් ද සඳහන් විය යුතුය. එම මුදලින් දර සඳහා රු. ............... ක් පමණ ද, ඉවුම් පිහුම් කරන අය සඳහා රු. .......................... ක් ද වැයවන බව කරුණාවෙන් සළකන්න.

**දානය සැපයීය යුතු පිළිවෙල,**

| | |
|---|---|
| **පෙර දින සවස 6.00** | **ගිලන්පස බුද්ධ පූජාව** |
| **පෙර දින සවස 6.30** | **ස්වාමීන් වහන්සේලාට හා යෝගීන්ට ගිලන්පස පිළිගැන්වීම.** |
| **රාත්‍රී 8.00** | **ධර්ම දේශනාව** |
| **අළුයම 5.00** | **කැඳ පිළිගැන්වීම (කැකුළු සහලින් පිසින්නේ නම් සුදුසුය)** |
| **පෙ. ව. 5. 30** | **උදෑසන බුද්ධ පූජාව** |
| **පෙ. ව. 6. 15** | **හීල් දානය** |
| **පෙ.ව. 8. 15** | **තැඹිලි නැතහොත් කිරි තේ යෝගීන්ට බෙදා දීම.** |
| **පෙ. ව. 10 .00** | **දහවල් බුද්ධ පූජාව** |
| **පෙ. ව. 10 .30** | **දානය සාංඝික කිරීම හා භුක්තානුමෝදනාව** |
| **පෙ. ව 11. 15** | **දහවල් දානය** |
| **පෙ. ව. 1. 30** | **සවස ගිලන්පස පිළිගැන්වීම.** |


**බැතිබර දායකත්වය සොලෙක්ස් වතුර පොම්ප නිෂ්පාදකයෝ**

# දායක පින්වතුන් හට උපදෙස් ස්වල්පයක්

01. දානය පිළියෙල කිරීමේදී අවශ්‍ය කරුණු උපස්ථායක මහතුන්ගෙන් විමසන්න.

02. මුළුතැන්ගෙයි ප්‍රයෝජනය සඳහා අවශ්‍ය උපකරණ උපස්ථායකයන්ගෙන් ලබාගන්න. කටයුතු අවසානයේදී ඔබ ලබාගත් උපකරණ පිරිසිදු කර භාර දෙන්න. උපකරණ වලට යම් අලාභ හානියක් වුවහොත් එය පිරිමැසීමට කටයුතු කිරීමද ඔබගේ යුතුකමකි.

03. ආහාර පිසීම සඳහා ගෑස් උපකරණ භාවිතා කිරීමට කැමති නම් ඒවාද සලකා දිය හැකිය.

04. මුළුතැන්ගෙය සහ අවට මිදුල ඉඳුල්බත් කසල දැමීමෙන් අපිරිසුදු නොකරන්න. බලු බළල් ආදී සතුන්ට තැන් තැන්වල ආහාර දැමීමෙන් වලකින්න.

05. කෑම ඉල්ලා පැමිණෙන යාචක ආදීන්ට මුළුතැන්ගෙය තුළ හෝ මිදුලට කැඳවා ආහාර දීමෙන් වළකින්න. ගේට්ටුවෙන් පිටතට ගෙන ගොස් දිය හැකි යමක් වේ නම් දීම සුදුසුය. (දායක පිරිසේ බඩු බාහිරාදිය නැතිවීම වැනි නොයෙකුත් අපහසුතා වලට හේතුවන නිසයි.)

06. මුළුතැන්ගෙයින් ඉවතලන ඉඳුල් බත් ඇතුළු සියළු අපද්‍රව්‍ය කුණු බක්කියට දමන්න. තැඹිලි කෝම්බ සතරට පලා දමන්න.

07. ඔබ සමග දන් දීමට පැමිණෙන පිරිස ඔබගේ අණට කීකරු විනීත පිරිසක් විය යුතුයි. එකී පිරිස කරන අවිනීත ක්‍රියාවක් වේ නම් ඒ සඳහා වගකිව යුත්තේ ඔබමය.

08. මත්පැන් පානය කර මෙම ශුද්ධ භූමියට පැමිණීම හෝ මෙම භූමිය තුළ තබාගෙන මත්පැන් පානය කිරීමද බරපතල වරදක් බව ඔබ සමග පැමිණෙන පිරිසටද වටහා දිය යුතුය. විශ්‍රාම ශාලාව තුළ හෝ මෙම භූමියෙහි සංගීත භාණ්ඩ පාවිච්චිය, කාඩ් ක්‍රීඩා වැනි දෑ නොකළ යුතු බව ද යලකන්න.

09. සුරා සොඬුන්, වැනි අවිනීත පුද්ගලයින් සමඟ මෙහි පැමිණීමෙන් ඔබගේ උරුමය අහිමිවීමට ඉඩකඩ ඇති බව සළකන්න.

10. අවේලොවන්හි භාවනා ප්‍රදේශයට ඇතුළු නොවන්න.

11. තම තමන් සතු බඩු බාහිරදිය ආරක්‍ෂා කර ගැනීමට සැලකිලිමත් වන්න.

12. නවාතැන් ගැනීම සඳහා විශ්‍රාම ශාලාවේ කාමර ලබා ගත හැකිය. ඒ සඳහා ලිපිකාර මහතාගෙන් විමසන්න.

13. භාවනා මධ්‍යස්ථානයේ අභිවෘද්ධිය සඳහා ඔබ ලබාදෙන ආධාර ලිපිකාර මහතාට භාරදී රිසිට් පතක් ලබා ගන්න.

14. උපස්ථායක කප්පිය කාරකාදීන්ගේ හෝ ඔවුන්ගේ සේවාව නිසි පරිදි නොලැබීමෙන් හෝ යම් අඩුපාඩු සිදු වුවහොත් හෝ වෙනත් දැන්විය යුතු අඩුපාඩු වෙතොත් ඒ බව මධ්‍යස්ථානාධිපති හිමිපාණන්ට දන්වන්න.

**මෙයට,**
**සියනෑ ජාත්‍යන්තර විපස්සනා භාවනා සමිතිය වෙනුවෙන්,**

කාර්‍ය්‍යභාර නිළධාරි

ගරු ප්‍රධාන ලේකම්
**කේ. ඩී. කේ. ගුණරත්න**

---

**සැළකිය යුතුය:** පින්වත, සංඝ උපස්ථාන හා දායක පින්වතුන්ගේ පහසුව සඳහා මෙහි සිටින උපස්ථායකයින්ගේ රාත්‍රි ආහාරය ද රාත්‍රී 8 .00 ට පමණ චාරිත්‍රානුකූලව ඔබගෙන් ඉටුවිය යුතු බව කරුණාවෙන් සළකන්න. දාන මාන සකස් කිරීමේ දී මිරිස් අඩුවෙන් යෙදීම සුදුසුය.